# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2162/25 - 2020 පෙබරවාරි මස 12 වැනි බදාදා - 2020.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011(ii)

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

8 (1) වන වගන්තිය යටතේ නියමය

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු වන මා විසින්, මේ නියමය මගින්, මේ නියමයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති මාර්ගය, ජාතික මහා මාර්ගයක් විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

ජොන්ස්ටන් ෂේවියර් ප්‍රනාන්දු,
මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය.

2020 පෙබරවාරි මස 11 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

**උපලේඛනය**

| *මාර්ගයේ නම* | *කොටස (කි.මී.)* | |
|---|---|---|
| | *සිට* | *දක්වා* |
| ***බස්නාහිර පළාත :*** | | |
| පැලවත්ත - අකුරේගොඩ - පොතුඅරාව මාර්ගය | 0.000 | 4.074 |

පනතේ 10 වන වගන්තිය යටතේ අවශ්‍යතා (ඇමුණුම 1)


1A - PG 4875 — 117 (2020/02)




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www. documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇමුණුම 1

(අ) පැලවත්ත - අකුරේගොඩ - පොතුඅරාව ජාතික මහා මාර්ගය සමන්විත ප්‍රදේශය නිශ්චිතව දක්වෙන සැලැස්ම

(i) (1) පළාත : බස්නාහිර

(2) දිස්ත්‍රික්කය : කොළඹ




පැලවත්ත - අකුරේගොඩ - පොතුඅරාව ජාතික මහා මාර්ගය

(ii) **ජාතික මහා මාර්ගයේ මංසන්ධි :**

| අනු අංකය | මංසන්ධියේ නම | පිහිටීම කි.මී. | මංසන්ධියට සම්බන්ධිත මාර්ග හා එහි වර්ගය | | | |
|---|---|---|---|---|---|---|
| | | | වම | | දකුණ | |
| | | | වර්ගය අයිතිය | පිවිසුම | වර්ගය අයිතිය | පිවිසුම |
| 1 | පැලවත්ත | 0+000 | ජා.ම.මා. (බී047) | බත්තරමුල්ල | ජා.ම.මා. (බී047) | තලවතුගොඩ |
| 2 | ආරක්ෂක මූලස්ථාන මංසන්ධිය | 0+906 | ජා. ම.මා. (බී642) | බත්තරමුල්ල | - | - |
| 3 | අකුරේගොඩ | 1+846 | ප.ස.මා. | බත්තරමුල්ල (රොබට් ගුණවර්ධන මාවත) | - | - |
| 4 | උඩවත්ත මාර්ගය මංසන්ධිය | 2+426 | ප්‍රා.ස.මා. | මාළඹේ | - | - |
| 5 | අමරගොඩ මාර්ගය මංසන්ධිය | 3+426 | - | - | ප්‍රා.ස.මා. | හෝකන්දර |
| 6 | පොතුඅරාව | 4+074 | ජා.ම.මා. (බී 240) | මාළඹේ | ජා.ම.මා. | අතුරුගිරිය |

වර්ගය :- ජා. ම. මා. = ජාතික මහාමාර්ග, ප. ස. මා. = පළාත් සභා මාර්ග, ප්‍රා.ස.මා. = ප්‍රාදේශීය සභා මාර්ග,

(iii) **ජාතික මහා මාර්ගයේ මාර්ග අංගෝපාංග :**

(අ) **බෝක්කු :**

| බෝක්කු වර්ගය | ගණන |
|---|---|
| හියුම් පයිප්ප | 01 |
| පෙට්ටි බෝක්කු | 08 |

(ආ) **පාලම් :**

| පාලම් අංකය | පිහිටීම (කි.මී.) | ගඟේ/ජල මාර්ගයේ නම | පාලමේ දිග (මීටර්) | ද්වාර ගණන | වර්ගය | මාර්ග පථයේ පළල (මීටර්) |
|---|---|---|---|---|---|---|
| 3/2 | 2+346 | - | 7.5 | 01 | කොන්ක්‍රීට් | 6.00 |

(iv) (1) ජාතික මහාමාර්ගය දෙපස ඉදිකිරීම් වල සීමාව : ජාතික මහාමාර්ගයේ මැදි රේඛාවේ සිට මීටර් පහළොවක් (මීටර් 15) දෙපසට

(2) මාර්ග අයිතියේ දිග : කිලෝ මීටර් 4.074 ක් වේ.

**(ආ) ජාතික මහාමාර්ගය හැඳින්වෙන නිශ්චිත නාමය** : පැලවත්ත - අකුරේගොඩ - පොතුඅරාව ජාතික මහාමාර්ගය

02 - 550

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.